# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2194/7 - 2020 සැප්තැම්බර් මස 21 වැනි සඳුදා - 2020.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි**

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

ජනාධිපති විධානය

1. බැසිල් රාජපක්ෂ මැතිතුමා
   ජනාධිපති විශේෂ නියෝජිත

2. ආචාර්ය නන්දලාල් වීරසිංහ මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව

3. ලුතිතන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා
   ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී / යුධ හමුදාපති

4. සී.ඩී. වික්‍රමරත්න මැතිතුමා
   වැඩ බලන පොලිස්පති

5. මේජර් ජනරාල් (විශ්‍රාමික) ශාන්ත දිසානායක මැතිතුමා
   සභාපති, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

6. ජේ.ඒ. නුෂාඩ් එම්. පෙරේරා මැතිතුමා
   සභාපති, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව

7. සුසන්ත රත්නායක මැතිතුමා
   සභාපති, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

8. ජයන්ත ද සිල්වා මැතිතුමා
සභාපති, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

9. කිමාලි ප්‍රනාන්දු මැතිතුමිය
සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

10. ජයම්පති මොල්ලිගොඩ මැතිතුමා
සභාපති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය

11. ප්‍රභාත් සුබසිංහ මැතිතුමා
සභාපති, අපනයන සංවර්ධන මණ්ඩලය

12. ඒ. විමලවීර මැතිතුමා
කම්කරු කොමසාරිස් ජනරාල්

13. එස්. සිංගප්පුලි මැතිතුමා
සමුපකාර සංවර්ධන කොමසාරිස්

14. රියර් අද්මිරාල් (විශ්‍රාමික) ආනන්ද පීරිස් මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

15. මේජර් ජනරාල් (විශ්‍රාමික) ජී. විජිත රවිප්‍රිය මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව

16. බන්දුල තිලකසිරි මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

17. සංජය මොහොට්ටාල මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

18. මේජර් ජනරාල් (විශ්‍රාමික) සුදන්ත රණසිංහ මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

19. මහේෂ් ගම්මම්පිල මැතිතුමා
අධ්‍යක්ෂ, පොහොර ලේකම් කාර්යාලය

20. බුද්ධික මඩිහහේවා මැතිතුමා
සාමාන්‍යාධිකාරී, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

21. රොහාන් සෙනෙවිරත්න මැතිතුමා
අතිරේක සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය

22. මනෝ සේකරම් මැතිතුමා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

23. මේජර් ජනරාල් (විශ්‍රාමික) සුමේධ පෙරේරා මැතිතුමා

24. සංජීව ගුණවර්ධන මැතිතුමා
විධායක නිලධාරී, ඊ.ඩබ්ලිව්. ක්‍රේසි සහ සමාගම

25. සමන්ත කුමාරසිංහ මැතිතුමා
අධිපති, නේචර්ස් සීක්‍රට් ආයතනය

26. ෂෙරාඩ් අමලියන් මැතිතුමා
නියෝජ්‍ය සභාපති, මාස් හෝල්ඩිංග්ස්

27. ආචාර්ය රවී ලියනගේ මැතිතුමා
සභාපති, රයිගම් මාර්කටින් සර්විසස් (පුද්ගලික) සමාගම

28. පද්මලාල් විතානගේ මැතිතුමා
කළමනාකාර අධ්‍යක්ෂ, සැන්මික් සමූහ ව්‍යාපාරය

29. එස්.බී. දිවාරත්න මැතිතුමා
විශ්‍රාමික නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්

30. අග්‍රාමාත්‍ය ලේකම් හා මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන, මාර්ග සහ මහාමාර්ග, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන, වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම, කර්මාන්ත හා සැපයුම් කළමනාකරණ, විදුලිබල හා බලශක්ති, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම්, ආරක්ෂක, අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන, විදේශ සබඳතා යන අමාත්‍යාංශයන්හි ලේකම්වරු

වෙත,

ශුභාශිංසන පූර්වකවය!

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, 2020.04.21 වැනි දින දරන ජනාධිපති විධානය මගින් පිහිටුවන ලද ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් ඔබතුමන්ලා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, මෙම බලකාය වෙත පැවරී ඇති කාර්යයන් තුළ ප්‍රාදේශීය සංවර්ධනය යන විෂයය සඳහා ඉහළ අවධානයක් යොමුකර ඇති බැවින් සහ එයට අදාළ කාර්යයන් ප්‍රාදේශීය මට්ටමින් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇති බැවින් ද,

එකී කාර්යසාධක බලකායේ සාමාජිකයෙකු ලෙස පත්කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මැතිතුමා වෙනුවට, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ, අතිරේක අධ්‍යක්ෂ ඩී.එල්. නිහාල් මැතිතුමා උක්ත බලකායේ සාමාජිකයෙකු වශයෙන් පත්කරමි.

තවද, 2020 අගෝස්තු මස 05 වැනි දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මා විසින් නව අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ සංඛ්‍යාව, අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් සහ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් නිශ්චය කරනු ලැබ ඇති හෙයින් සහ එතෙක් පැවති අමාත්‍යාංශයන්හි නාමයන් වෙනස්වී ඇති හෙයින් ද,

මේජර් ජනරාල් (විශ්‍රාමික) සුමේධ පෙරේරා මැතිතුමා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කරනු ලබන බැවින් ද,

උක්ත වෙනස්කම් සැළකිල්ලට ගනිමින් අංක 23 යටතේ වන එකී නම ඉවත් කොට අංක 30 හි දැක්වෙන තනතුරු නාමයන් පහත පරිදි සංශෝධනය කරමි.

අග්‍රාමාත්‍ය ලේකම්, මුදල්, ආරක්ෂක, මහාමාර්ග, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන, වැවිලි, කර්මාන්ත, විදුලිබල, බලශක්ති, අධ්‍යාපන, කෘෂිකර්ම, වාරිමාර්ග, නාගරික සංවර්ධන හා නිවාස, ජල සම්පාදන, වෙළෙඳ හා විදේශ යන අමාත්‍යාංශයන්හි ලේකම්වරු.

වර්ෂ දෙදහස් විස්සක් වූ සැප්තැම්බර් මස 16 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.